
වියදම අනුව බැලුවොත් අපි දෙන්නම අක් කරයකින් ගන්න ලාබේ එකයි. ඒත් තෙන්න කෝන් උන්නැහේගේ අස්වැන්න මගේ වගේ දෙගුණයක්. දැන් කාලේ හැටියට රටට යුතුකම කරන්නේ එයයි. වැඩි අස්වැන්න. එයා පරද් දන්න අපට බැහැ.—**පලදවර්ධන හිටපු සභාපති.** මොනවද මහත්තයා නියරකවත් තණකොළ ගහක් නැහැ ගොයම ගැන මොකටද ඉතින්. මිනිහා දස්සයා. — **හීලෝගම විදුහල්පති**



තෙන්නකෝන් මහතා

# බීජී 90 – 2 න් බුසල් 150 ක් ගත් විස්කම් ගොවියා

අපි පරම්පරාගත දුප්පත් ගොවියෝ. දැන් කියන හැටියට නම් වියලි කලාපයේ ගොවි යෙක්. ඒත් මම නම් ගොවිආර නිසාවෙන් කුඹුරට බැස්ස කෙනෙක් නෙවි.

නිකවැරටියේ හීලෝගම තෙන්නකෝන් මහත්තයා අපිත් එක්ක කතාව පටන්ගත්තේ ඔහොමයි. අපි එයාගේ කුඹුරට ගියේ මද්ද හනේ. එතකොටත් දහයක් පහළොවක් එක දිගට වැඩ. කපාපු ගොයම් ගොඩට ගේනවා. කට්ටියක් පාගනවා. හුළං ගහනවා. ගෝනිවලට දමනවා.

ඒ කාලේ මම ප්‍රාචීනෝට ඉගෙන ගත්තු කොලු ගැටයෙක්. තාත්තා දුක් මහන්සියෙන් ඉගැන්නුවා. මම නම් කුඹුරෙන් පිට රස්සා වක් කරන්න තමයි හිටියේ. ඒත් 1948 දී තාත්තා මැරුණා. ප්‍රාචීනෝ තියෙද්දී ජීවත් වෙන්න කුඹුරට බහින්න වුනා. මම ගොවි තැනට වැටුනේ එහෙමයි. අපේ පවුලට අක්කර පහක් විතර තිබුණ. ඕකේ කන්න වල හැටියට හීනටි, දික්වී, පච්ච පෙරුමාල් වැපුරුවා. අක්කරේකට බුසල් 25–30 ක් ගත්තා. එද වෙලා කන්න සැහුණා. කන්න ඔය තරම් මැරෙන්න ඕනද කියලා මම හිත හිතයි තිබුණේ.

1950 මම ආණ්ඩුවේ ඕවර්සියර් කෙනෙක් වුනා. ඒකෙනුත් ඉතින් ජීවිතේ ගැට ගහ ගන්නට වැඩි යමක් බැහැ. ටික ටික ගොවි තැන් කළා. ඒකෙනුත් අස්වෙලා 1955 දී විතර වී මෝලක් ගත්තා. ගමේ ගොඩේ වී කොටන්න. ඔය කාලේ පෙළවාසියක් එහෙ මත් වෙලානේ. දරු පවුල රැකගන්නත් ස්ථිර ආදයමක් ඕන වුනා.

උරුමෙට හරි කරුමෙට හරි මට කුඹුර ගැන තිබිච්ච උනන්දුව අඩුවුනේ නැහැ. තරමක පතපොතේ දැනුමක් තිබුන නිසා අවට සිදුවෙන දේ ගැන සැහෙන හැඟීමක් තිබුණා. නිකවැරටිය ආණ්ඩුවේ ආදර්ශ වී ගොවිපලක් තිබුන මේ කුඹුරේම. ඒකෙනුත් ක්‍රමානුකූල වී ගොවිතැන ගැන දැනුමක් ගම්මුන්ට ලැබුණා. පස්සේ ගොවිපල වහල දැම්මා. කුඹුරු විකුණන කොට මේ අක්කර අට මම ගත්තා. ඒ 1960 දී. ඒ වෙනකොට මම හිතලයි තිබුනේ පොලොව එක්කම හැපෙන එක තමයි අපේ උරුමේ කියලත්.

බතලගොඩ මහත්තුරු කිව්වා තෙන්න කෝන් මහත්තයා මේ පැත්තේ නොම්මර එකේ ගොවියෙක් නවීන පන්නේ ගොවි මහත්තෙයෙක් කියලා. මොකද එහෙම කියන් නේ? වී මෝල කරද්දිත් මම ගොවිකම ගැන

පොත්පත්, සඟරා, පත්තර කියෙව්වා. දෙපාර්තමේන්තුවේ මහත්තුරු එක්කත් සම්බන්ධකම් තිබුණා. ඉතින් 1960 දී මම ආයෙත් කුඹුරට බැස්සා. මුල්සැරේ පොක්කාලි දැම්මා. අක්කරයකට බුසල් හතලිහක් ගත්තා මට මතකයි අද වගේ. වී පේළියට දමලා වල් නෙලලා, ආවාට ගියාට නැතිව ගොවිතැන් කළා.

## අළුත් වී

අළුත් වී ජාති ගැන දැනගන්නේ කොහොමද? එහෙම අවුරුදු තුන හතරක් පරණ වී ගොවිතැන් කලා. 1964 දී තරම තමයි අළුත් වියක් මේකේ දැම්මේ. එච් 4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහත්තුරුයි ඒක දුන්නේ ඒක හොඳට හැදුනා. බුසල් 70 ක් විතර ගත්තා. සෑහෙන්න අස්වැන්න වැඩියි. පරණ විය කුඹුරේ හැදුණා අලුත් ඒවාට නම් පෝර දමන්න උනා. ලෙඩරෝග ආවා. ඒත් බෙහෙත් තිබුනනේ. මම දිගටම අලුත් වී ජාතිම ගොවිතැන් කළා. එච් 8 න් මම බුසල් 75 ක්. බීජී 11 න් බුසල් 100 ක්. අයිආර් 8 න් බුසල් 125 ක් තරම් ඇති අයිආර් 262 තමයි මට ගොවිතැන් කරන්න අමාරු වුනේ. අනෙක්වා ගොවිතැන් කළා.

අතමිට සරුවෙන්න ඇතිනේද ඔය කාලේ. අපෝයි ඔව්. ඒත් ගොවිතැන අතහැරියේ නැහැ. වී මෝල අතඇරියා මියක්. මට තේරුණා මේකම තමයි හොඳම රස්සාව, කියලා. ගොවිතැන ඉස්සර වගේ කරන්නත් වාලේ කරපු දෙයකුත් නෙවි. අළුත් ක්‍රම අළුත් වී, වැඩි වියදම්, වැඩි අස්වැන්න. ඒ එක්කම ආදයම.



වී හුළං ගසා ගෝනිවලට

බතලගොඩ නැත්නම් බීජී වී කොහොමද? ඒවා තමයි මම ගොවිතැන් කරපු හොඳම විය. දැන් මේ කන්න පහක් විතර වැපුරුවේ බීජී 90 – 2. මුල් කන්න දෙකේ එතරම් හරිගියේ නැහැ. තුන්වෙනි කන්නේ අක්කරෙන් බුසල් 140 ක්. ඊළඟ එකේ 120 යි. මේ ගමන 150 ක්. මිනිස්සු කියන දෙයක් තමයි මේවාට වියදම වැඩියි. පෝර බෙහෙත් ඕන කියලා. මුලදී අමාරුවෙන් කලත් වටිනවා. වියදම ලැබෙන එක සහතිකයි. හරියට කරහම.

ආදයම ගැන නැතත් මේ ගමන වියදම් ගැන අපිට කියන්න පුළුවන්ද? මේ පොතේ සේරම විස්තර. කුඹුරට කරපු හැම වියදමක්ම තියෙනවා. මට අක්කරයකට රු:2300 ක් විතර යනවා. බිම සකස් කරන්න රු: 500 ක් විතර. ගොයම් කපලා ටික දවසකින් එම පිදුරු ආපසු කුඹුරට දලා. ඉපනැල්ලත් එක්ක පුච්චලා දමනවා. ආයේ දහසියා පුච්චලා දමනවා. ඒක පසට හොඳ මුල් පෝරක්. පෝරු ගාලා එහෙම කුඹුරු හදගන්නවා. තෙල් බෙහෙත් වියදම රු 1000ක් විතර. පෝර රු. 275 ක්. වල් නෙලන්න රු. 400 ක්. ඔය මූලිකම වියදම් යනහැටි.

## ලෙඩ රෝග

මම කවදවත් පැල හිටවලා නැහැ. හැම දම වී පේළියට දමන එකයි කරන්නෙ. ඒක නම් හොඳයි. අනික වපුරපු දවසේ ඉඳලා කරල් පැහෙන තුරු අක්කරයකට එක් කෙනෙක් තරම් දිනපතා වැඩ කරනවා. අනෙක් කාරනේ ගොයම් කපලා පස්සෙන් දම පාගා ගන්නවා.

වැඩි අස්වැන්නක් ලැබීම නිසාම අළුත් වී ගොවිතැන් කිරීමට තෙන්නකෝන් මහතා පෙළඹී ඇත. ඒවා වගා කිරීමටද කිසිදු අපහසුවක් නැති බව කියන ඔහු ලෙඩ-රෝග එකම කරදරය වුවද බෙහෙත් මගින් ඒවා පාලනය කළ හැකි බවද කිව්වා.

මුලින්ම ගොක් මැස්සා, ඊළඟට පුරුක් පණුවා, කොළපාළු රෝගය, කීඩැවා, අන්තිමට ගොයම් මැස්සා. -- ඔය හැමෝටම බෙහෙත් තියෙනවා. හැබැයි කවුරු හරි මේ බෙහෙත් පාලනයක් කරන්න නම් ඕන. මේ

**''කාලා කීයක් හරි ගන්න තිබුනොත් ඇති කියන ගොවි චින්තනය වෙනස් කරන තුරු ලංකාවේ අස්වැන්න වැඩි කරගන්න හරි අමාරුයි. මිනිස්සු මෙහෙම හිතද්දී අළුත් ගොවිතැන් ක්‍රම වැඩි අස්වනු වී ජාති කොච්චර අඳුන්නලා දුන්නත් පලක් ගන්න බැහැ.**

කුඹුරට කලින් ගහපු ගහපු බෙහෙත් ජාති දෙකක් තිබුනා. ඒවා ගැහුවාම දියබරි, ගෙම්බෝ, මාළු, කක්කුට්ටෝ මැරිලා ගොයම සොහොනක් වාගේයි. තෙල් ගහපු මිනිහටත් එක දිගට දවස් දෙකකට වැඩිය වැඩ කරන්න බැරිවුනා. හොඳ කෘමි බෙහෙත් වලින් එහෙම වෙන්න බැහැනේද?

බිත්තර වී ගන්නේ කොහොමද? මුලින්ම ව්‍යාප්ති කන්තෝරුවෙන්. ඊට පස්සේ මමම හද ගත්තා. වී පාගන්න කලින් මම බිත්තර වී හද ගන්නවා. පාගපු විය හුඟාක් වේලා වට හරි නැහැ. ගොයම් කපලා කොල කැටිය හදනකොට වී ඇට වැටෙනවා. පාගන්න කොළකැටිය කඩන කොටත් වී වැටෙනවා. ආයේ ගේන කොට. මම ඕවා එකතු කරවනවා. මේ අක්කර අටින් බුසල් 40 ක් විතර ඔහොම හද ගන්නවා. මේ ටික හොඳට වේලලා අරන් තියා ගන්නවා.

ඉතා නිහතමානී ගොවි මහතෙකු වන තෙන්නකෝන් මහතා දූන් කුඹුරේම කුඩා නිවසක් යාද එහි පදිංචි වී ඇත. වී වැපුරු ද සිට කරල් පැසෙන තුරු ගොයම දැඩි උනන්දුවකින රැකගැනීම ඔහුගේ සිරිතය. තමාට තනිවම අක්කර දෙකක වගා කටයුතු පහසුවෙ කළ හැකිවුවද ප්‍රදේශයේ රැකියා ඉඩ සැලසීම සඳහා සෙසු අයගේ සහාය ලබාගනී. තමාට ජීවිකාව අපහසු නොවූනද අපහසු අයට අතදීම ගැමි ජීවිතයේ සිරිතක් බව ඔහු කියයි.

**රටේ ජනගහනය වැඩි වුනද කුඹුරු අක්කර ගණන වැඩි නොවීම නිසාම හැම දෙනම වැඩි අස්වනු දෙන අළුත් වී වගා කළ යුතුම බව ඔහුගේ අදහසයි. සිංහල වී වලින් මෙහෙම අස්වනු ගන්න බැහැ. මේ කාලෙට ඔබින්නේ අළුත්වී තමයි. මෙම ජාතික වගකීම ඉටු කිරීමට නම් 'ගොවිචින්තනය' වෙනස් කළයුතු බව ඔහු කිවේ මෙහෙමයි.**

අපේ රිදී බැඳි ඇල වතුරෙන් අක්කර 8000 ක් පමණ වී ගොවිතැන් කරනවා. ඒත් වගාවේ වගේ ඔවුන්ගේත් දියුණුවක් නැහැ. සාමාන්‍ය අස්වැන්න බුසල් 70–75 ත් අතර. මේක අඩු තරමෙ 125 ක් කරන එක අමාරු නැහැ. එයාලා ගොවිතැන ගැන වැඩි කාල යක් ගත කරනවා නම්. මම 'චින්තනය' කීවේ මිනිස්සු හුඟක් තමන් කාලා විකුණලත් කීයක් හරි ගන්න ලැබුණොත් ඇති කියලයි කියන්නේ, ඒ අදහස වෙනස් කරන තුරු ගොවිතැන හරියන්නේ නැ. හාල් රටින් ගෙන්නන්ට වෙනවා. නව සාධක ඉදිරිපත් කර ඒවා ක්‍රියාත්මක කරවීම කරන්නටම ඕනැ.

ග්‍රාමීය මට්ටමේ ආයතන මෙන්ම ගොවි ණය දීමද මනාව පාලනය කර සංවිධානය කළයුතු බව ඔහුගේ අදහසයි. සාමූහික ක්‍රමය හොඳ වුවත් ක්‍රියාත්මක වන්නේ ඉතා අසාර් එක අයුරින් යයිද ඔහු කීවා. අළුත් නීති රීති හොඳයි. ඒත් මිනිස්සු කැමති තම තමන් කතා කරලා දියුණු වෙන්නයි. හුඟාක් අය එහෙම කරනවා. මමත් නිතරම යායේ යනවා. අනෙක් මහත්වරු මෙහේ එනවා. හීලෝගම පාළු එකක්. ඒත් එකමුතුකම තියෙනවා. ප්‍රශ්නයක් වුනොත් නිලධාරීන් හමුවෙන්න යනවා. ඒත් ව්‍යාප්ති කටයුතු නම් ගම් මට්ට මට නොගෙන නියම ප්‍රතිඵල ගන්න බැහැ. පොදු සංවිධාන හරිහැටි නොකිරීම නිසායි මිනිස්සු ඒවට උනන්දු නොවෙන්නේ. අවශ්‍ය උපකාර වෙන වෙනම ලබා ගන්නවා මිසක්.

තෙන්නකෝන් මහත්තය දූන් කුඹුරටම වෙලා හිටියට පෙලවාසියක් වුනයි නේද? අපි ටිකක් විස්තර දැනගන්න කැමතියි. අපි නව පැත්තක් මතක් කළා.

මව තිඹිරියාවේ. ළමා එතනා මේ හීලෝගට. අපි බැන්දේ 44–45 තරම. පුත්තු හතර දෙනෙක් ඉන්නවා. ලොක්කා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරියෙක්-ගල්ගමුවේ. දෙවැන්නා තමයි දූන්

වී මෝලෙ වැඩ. අනිත් පුතා උපාධි අරන් දූන් උගන්වනවා. බාලයා පේරාදෙනියේ රසායන විද්‍යාව වගේ එකක් කරනවා. මට දූන් අවුරුදු හැටක්. දරුවොත් රස්සාවල් කරාට ගොවිතැන ගැන උනන්දුයි. මේක මම කරනවා. එයාලත් කුඹුරු කරන්න හොයනවා. මේක ඉතින් එයාලට දෙන්න දෙයක්යැ. අපේ ගොවිආර පිට යන්නෝ නැහැ මම එයාලට ඉගැන්නුවේ මගේ තාත්තා වගේම දුක් විඳලා. පිහිටක් වූයේ ගොවි තැනින්. ඒක ජම්මෙන් පිට යන්න බැහැ නේ.

තව එක ප්‍රශ්නයක්? බතලගොඩ මහත් වරු කිව්වා වගේ තෙන්නකෝන් මහත්තයා හැම අතින්ම සාර්ථක ගොවි මහත්තයෙක් උනේ ඇයි?

මම ඇත්තෙන්ම නිතර වටපිට ගැන සෝදිසියෙන් හිටිම තමයි මුල් කාරනේ. නැත්නම් අලුත් දේ දැනගන්න බැහැ. කාලයට අනුව හැඩ ගැසුණා. අනිත් එක වී ගොවිතැනෙන් පිට නොපැන්න එක. කව්ටි පැන්නත් ආයේම මේකටම ආවනේ. කරලා එපාවෙලා ආයෙම ආවා. වී ගොවි තැන තමයි අපේ කොඳු නාරටිය. අනික වාම් ජීවිතේ. රට වෙනස් වෙන එක ඇත්ත. නමුත් අපි අපේ තරමට රට ගම ගැන හිතලයි වෙනස් වෙන්න ඕන.

වෙන ඉතින් මොනවද මහත්තයෝ මිනි හෙක් හැටියට මම හොඳින් ජීවත්වෙලා තියෙනවා. මිනිහෙක් හැටියට මට මැරෙන් න පුළුවන්. මම ළඟදී ලොකු වටවන්දනා වක් ගියා. මේ පැත්තේ ගොවි මහත්තුරුත් එක්ක ලංකාවේ හොඳ ගොවිපලවල් බලන්න යන්න ලොකු ආශාවක් තියෙනවා. තෙන්න කෝන් මහත්තයා වී සුළං ගහන තැනට ගියා. අපි එන්න පිටත් වුනා.

එනගමන් හිලෝගම ලොකු ඉස්කෝලේ මහත්තයා හමුවුනා.

මහත්තයලාද තෙන්නකෝන් වත්තට ආවේ. උන්නැහේ තමයි මේ පැත්තේ හොඳ ම ගොවියා. නියරකවත් තණකොල පැල යක් නැහැ. හැමදම දහයක් දෙලහක් වැඩ. ඒකත් දූන් කාලේ ලොකු දෙයක් නේ.

නිකවැරටියේදී පළාදවර්ධන කමිටුවේ හිටපු සභාපති බෝගොල්ලාගම මහත්තය හමු වුනේත් අහම්බෙන් වාගේ. අපි එයාගෙනුත් තෙන්නකෝන් මහත්තයා ගැන ඇහුවා.

**මගේ කුඹුර තියෙන්නේත් ඒ ළඟම. මමත් උත්සාහ අරන් වැඩකරා. කරනවා. ඒත් මිනිහා පරද්දන්න බැහැ. කාරනේ මේකයි. අපි රුපියල් දහක් වියදම් කරලා අක්කරෙන් බුසල් 70 ක් විතර ගන්නවා. අපිට ඇති කියලා හිතෙනවා. එය දෙදහක් වියදම් කරලා ඒ වගේ දෙගුණයක් ගන්නවා. දෙන්නගෙම ලාබේ එකයි. ඒත් රටට වැඩි ප්‍රයෝජන එයාගෙන්. වැඩි අස්වැන්න දෙන් නේ තෙන්නකෝන් උන්නැහේ.**

අනික එයා කුඹුරේම ඉඳගෙන ඒක කර නවා. වෙන වැඩ පටලගන්නේ නැතුව. අවංකවම මිනිහා ආදර්ශමත් ගොවි මහත්ත යෙක්.

උනන්දුවත්, අධිෂ්ඨානයත් තියෙනවා නම් අපේ අනෙක් ගොවි මහත්වරුන්ටත් තෙන් නකෝන් මහත්තය වගේ වෙන්න බැරි කමක් නැහැනේද? බතලගොඩ ගමන නික-වැරටියෙන් කෙළවර කරන්න වෙච්චි එක අපටත් ලොකු සතුටක්. අත් දැකීමක්.